# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# වයඹ පළාතේ පළාත් සභාව

## 1989 අංක 03 දරන
## පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය

(අනුමත කළ දිනය : 1989.08.23)

වයඹ පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 ජූනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ vi අ කොටසේ පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයෙන් මිළදී ගත හැක.

මිළ රු. 5.00 තැපැල් ගාස්තුව රු. 2.00

වයඹ පළාතේ පළාත් සභාවේ

1989 අංක 03දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය

වයඹ පළාතේ පළාත් සභාවේ සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභානායකවරයාට හා විපක්ෂනායකවරයාට ද, වයඹ පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා සාමාජිකයන්ට ද වැටුප් හා දීමනා ගෙවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා වන ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය, "වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 03 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

ගෙවිය යුතු වැටුප් හා දීමනා.

2. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයෙන් පසුව,

(අ) වයඹ පළාතේ පළාත් සභාවේ සභාපතිවරයාට ගෙවිය යුතු මාසික වැටුප හා දීමනා තත් කාලයෙහි වයඹ පළාතේ පළාත් සභාවේ අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන වැටුප් හා දීමනා වලට සමානව ද,

(ආ) වයඹ පළාතේ පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවිය යුතු මාසික වැටුප සහ දීමනා තත් කාලයෙහි වයඹ පළාතේ පළාත් සභාවේ අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන වැටුපෙන් සහ අනිකුත් දීමනා වලින් ඉතෙනු ලෙසකු සහ තත් කාලයෙහි වයඹ පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුට ගෙවනු ලබන, එහෙත් වයඹ පළාතේ පළාත් සභාවේ අමාත්‍යවරයෙකුට ගෙවනු නොලබන සියළු දීමනා වලට සමානව ද,

(ඇ) වයඹ පළාතේ පළාත් සභාවේ සභානායකවරයාට ගෙවිය යුතු මාසික වැටුප සහ දීමනා තත් කාලයෙහි වයඹ පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුට ගෙවනු ලබන වැටුප් හා දීමනා හා අතිරේක රුපියල් එක් දහසක අතිරේක දීමනාවකට සමානව ද,

(ඈ) වයඹ පළාතේ පළාත් සභාවේ විපක්ෂනායක වරයාට ගෙවන මාසික වැටුප සහ දීමනා තත් කාලයෙහි වයඹ පළාතේ පළාත් සභාවේ අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන වැටුප සහ දීමනා වලට සමානව ද,

88 003851 —2,500 (92/09)

(ඉ) වයඹ පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට ගෙවනු ලබන මාසික වැටුප රුපියල් හාරදහසක් ද,

(ඊ) වයඹ පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකුට ගෙවනු ලබන මාසික වැටුප රුපියල් තුන් දහසක් ද,

විය යුත්තේ ය.

**වැටුප් හා දීමනා පළාත් අරමුදලට වැය බරක්වීම.**

3. මෙම ප්‍රඥප්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභානායකවරයාට සහ විපක්ෂ නායකවරයාට ද, වයඹ පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට ද ගෙවනු ලබන වැටුප් හා දීමනා වයඹ පළාතේ පළාත් අරමුදලට වැය බරක් වන්නේය.